**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**

**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
kfsph;> rpWth; mYty;fs; kw;Wk; r%f ghJfhg;G mikr;R - r%fghJfhg;G gphpT
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No ..DSD/HO/14/18/එකලේබ.. | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................................... | දිනය<br>திகதி<br>Date ..2020.03.23.............. |

දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධී නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමණාකරුවන්, සංවර්ධන නිලධාරින් වෙත,

**<u>සමෘද්ධිලාභීන්ගේ සහනාධාර නිසිකලට ලබාදීම හා එදිනෙදා අවශ්‍යතා සපයාදීම.</u>**

වර්තමානයේ රට තුල උද්ගත වී ඇති කොරෝනා වෛරස් රෝග තත්වය හේතු කොට ගෙන සමස්ත ජන ජීවිත වලට දැඩි බලපෑමක් එල්ල වී තිබේ. එවන් පසුබිමක් තුල රට පුරා වෙසෙන සමෘද්ධි සහනාධාරලාභින් හට ලබා දෙන මාසික සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ප්‍රමාදයකින් තොරව ඔවුන් අතට පත් කිරීමට කඩිනම් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ. ප්‍රතිලාභීන් එක් ස්ථානයකට රැස් නොවන අයුරින් සහ සියළුම පාර්ශවවල ආරක්ෂාව තහවුරු වන අයුරින් කොරෝනා රෝගි තත්වය මැඩලීමට මේ වන විටත් රජය ලබා දී ඇති උපදෙස් පිළිපැදීමද මෙහිලා අවධානය යොමු කළ යුතු වේ.

02. ඒ අනුව දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශිය සමුපකාර සමිති සහ ගම් මට්ටමේ පිහිටා ඇති සමුපකාර අලෙවිසැල් සමඟ සාකච්ඡා කොට සමෘද්ධි සහනාධාරලාභීන් හා සමෘද්ධි බැංකු වල ගිණුම් හිමි ගණුදෙනුකාර අඩු ආදායම්ලාභින්ටද අත්‍යවශ්‍ය ආහාර මල්ලක් ලබා දීමට ක්‍රියා කළ යුතු වේ. අනතුරුව අදාල සමෘද්ධි බැංකුව මගින් සමුපකාර අලෙවිසැල් සඳහා මුදල් ගෙවීමටත් දෙවනුව, එම මුදල් ගිණුම් හිමියන්ගේ එකඟතාවය මත එකී ගිණුම් වලින් ප්‍රතිපූර්ණය කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. එමෙන්ම සතොස හා ලක් සතොස වැනි ආයතනවල සේවය ද මේ වෙනුවෙන් සලසා ගත හැකිය.

03. සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ග්‍රාමීය මට්ටිමන් පිහිටුවා ඇති සමුපාකාර අලෙවිසැල් සංඛ්‍යාව සීමා සහිත හෙයින් දුරස්ථව පිහිටි වසම් සඳහා ආහාර මළු ප්‍රවාහනයට සුදුසු ක්‍රමවේදයක් සකසා ගත යුතු


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

වේ. ඒ සඳහා ප්‍රජා මුල බැංකු සමිති, ප්‍රාදේශීය සංවිධාන හා ප්‍රජාමුල සංවිධානවල මැදිහත්වීම මත අදාල පහසුකම් සපයා ගැනිමට කටයුතු කළ යුතු වේ.

04. මෙම සමස්ත ක්‍රියාදාමය සඳහා වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි සහ ප්‍රජාමූල සමිති වල නිලධාරීන් සෘජුවම සම්බන්ධ කර ගැනීම වඩාත් උචිත වේ. විශේෂයෙන්ම මෙය ප්‍රමුඛතාවය ලබා දිය යුතු කටයුත්තක් ලෙස සලකා ඊට අදාල කටයුතු කඩිනමින් සිදු කිරීමට වැඩිදුරටත් කාරුණිකව උපදෙස් ලබා දෙමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්-
1. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ - කා.දැ.ගැ.පි.
2. රාජ්‍ය ලේකම්, සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
5. සියළුම ප්‍රජා මුල හා ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරුන් - අ.ක.ස.
6. සියළුම බැංකු හා බැංකු සමිතිවල සභාපතිවරුන් - අ.ක.ස.